රුහුණ විශ්වවිද්‍යාලය

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - 2016/2017

පළමු සමාසික අවසාන පරීක්ෂණය - 2017 ජූලි

SOC 6142 - උසස් සමාජවිද්‍යා න්‍යාය

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(පැහැදිලි අත් අකුරින් පිළිතුරු ලිවිය යුතුය.)

කාලය : පැය 03 යි.

---

01. 20 වැනි සියවසේ ලෝක ධනේශ්වර සමාජ ක්‍රමය පිළිබඳ විද්‍යාත්මක විශ්ලේෂණයක දී, න්‍යායාත්මක පදනම ලෙස රැල්ෆ් ඩැරන්ඩෝෆ් විසින් ඉදිරිපත් කරන ලද නව සිද්ධාන්ත යොදා ගැනීම කොතෙක් දුරට යෝග්‍ය වන්නේ දැයි පෙන්වා දෙන්න.

02. බුද්ධි ප්‍රබෝධයත් සමඟ ම මතු වන තෝමස් ජෙපර්සන් ඇතුළු දාර්ශනිකයන් විසින් සමාජය හමුවේ තබන ලද විවිධ ඉගැන්වීම් කෙටියෙන් දක්වා, ඒවා මගින් සාම්ප්‍රදායික සමාජ ක්‍රමය වෙනස් කිරීම අරභයා කරන ලද බලපෑම නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

03. පුද්ගලයා හා සමාජ ක්‍රමය පිළිබඳ ජීන් ජැක්ස් රූසෝ විසින් ඉදිරිපත් කරන ලද විප්ලවකාරී නව අදහස්වල ඇති වැදගත්කම ඔබ විවරණය කර දක්වන්නේ කවර ආකාරයටද?

04. කෘත්‍යවාදය කෙටියෙන් හඳුන්වා, ආචාරශීලී සංවර්ධිත සමාජයක් ගොඩ නගා ගැනීමේ දී පවුල නැමැති ප්‍රාථමික සමූහය මගින් රඟ දැක්විය යුතු භූමිකාව කෙතරම් වැදගත් වන්නේ ද? පැහැදිලි කරන්න.

05. <u>එක්කෝ,</u>

නවීන ලෝක සමාජය පද්ධති සමූහයක සංයුතියෙන් නිර්මාණය වන බව නික්ලාස් ලූමන්ගේ මතය යි. ඔබගේ අභිමතය පරිදි තෝරා ගත් නිදසුන් දෙමින් පැහදිලි කරන්න.

<u>නැත්නම්,</u>

අති සංකීර්ණත්වයකට ගොදුරු වෙමින් පවතින වත්මන් ලෝක සමාජය තුළ යමෙකු සිය ජීවිතය පවත්වාගෙන යාමට නම් යථාවබෝධය පසෙක ලා විශ්වාසය මත කටයුතු කිරීමට සිදුවනු ඇති බවට ලූමන් විසින් ඉදිරිපත් කළ තර්කය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

06. ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුළය කෙටියෙන් හඳුන්වන්න. එම ගුරුකුලය ස්ථාපනය කිරීමෙන් මුදුන්පත් කර ගැනීමට අපේක්ෂා කරන ලද අරමුණු මොනවා දැයි පෙන්වා දෙන්න.

07. ව්‍යුහවාදී එළඹුමේ මූලික ලක්ෂණ පැහැදිලි කර ඊට අදාළ විවේචන විභාග කරන්න.

@@@@@@@